# දින 12න් විකිණී අවසන් වූ රූකාන්ත සහ පවුලේ ප්‍රසංගය "රූ සඳ රෑ"








රූ 2017 "රූ සඳ රෑ" ඕස්ට්‍රේලියා හා නවසීලන්ත සංචාරය මේ සතියේ සිඩ්නි නුවරින් ඇරඹෙනවා.

වසර 2කට පසු රූකාන්ත සහ චන්ද්‍රලේකා ඕස්ට්‍රේලියාවට පැමිණෙනවා. ප්‍රසංග 7ක් මෙම සංචාරයට ඇතුලත්.

2015 දී රන් රූ නරඹන්නට රස විඳින්නට රසිකයන් 6500ක් ඕස්ට්‍රේලියාව හා සීලන්තයේ දී සහභාගීවූ බව ඔබට මතක ඇති. එවන් වාර්තගත සංචාරයකට පසු ඔවුන් මෙවර පැමිණෙන්නේ සිය පවුලේ ප්‍රසංගය "රූ සඳ රෑ" සමග ප්‍රථම වතාවටයි.






මෙවරත් සංගීත අධ්‍යක්ෂණය 2016 හොඳම සංගීත අද්‍යක්ෂණය සම්මානයෙන් පිදුම් ලද සුරේශ් මාලියද්ද ගෙන්. ඔහු සමගින් සත් සාමාජික ලාංකික වාද්‍ය වෘන්දයක් සංගීතයට එක්වෙනවා.

නිවේදනය සඳහා "මා නොවන මම" වැඩසටහන හරහා සැමගේ හද බැඳගත් කැලුම් ශ්‍රීමාල් ශ්‍රී ලංකාවෙන් සහභාගීවෙනවා

මෙවර ප්‍රසංගයේ විශේෂත්වය වන්නේ රූකාන්ත සහ චන්ද්‍රලේඛා ගේ දියනියන් වන රයිනි හා වින්ඩි වගේම ලාංකික සංගීතයේ අනාගත තරුව ලෙස සැලකෙන සනුක වික්‍රමසිංහ සහභාගී වන ප්‍රථම ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත සංචාරය වීමයි.

ප්‍රසංග 7 කින් යුත් "රන් රූ 2017 - රූ සඳ රෑ" සම්පූර්ණ සංචාරය මෙවර සංවිධානය කරන්නේ මෙල්බර්න්හි මාලක යාපා විසිනි.

මෙල්බර්න් ප්‍රසංගය සඳහා ඇති අධික ඉල්ලීම නිසා දින 12ක් තුල මෙල්බර්න් 6.30 දර්ශවාරයේ සියලුම ප්‍රවේශ පත්‍ර විකිනී අවසන් වුනා. මේ නිසා මෙල්බර්න් සඳහා පමණක් සවස 2.00ට අමතර ප්‍රසංග වාරයක් ආරම්භ කර තිබෙනවා .

එතෙර පැවත්වෙන ශ්‍රී ලාංකික ප්‍රසංගයක දර්ශන වාරයක් මාස 2කට පෙර සියලුම ආසන (1,000) විකිනීයාම ප්‍රථම වරට සිදුවූ අවස්ථාව ලෙස මෙය සඳහන් කල හැකියි.

